ලිංගික අපරාධයකට හෝ ලිංගික අපයෝජනයකට ලක් වූ අයෙකුගේ අනන්‍යතාවය හෙළි නොකළ යුතු බවට මාධ්‍ය ආචාර ධර්ම වලින් උපදෙස් ලබාදේ. ඇතැම් රටක නීතියට අනුව ද එය නොකළ යුත්තකි. එම අනන්‍යතාවය හෙළිදරව් කිරීම, සෘජුව මෙන්ම වක්‍රාකාරීව ද සිදු නොකළ යුතු වේ.
රඹුක්කන බාලවයස් දැරියකට බරපතල ලිංගික අපයෝජනයක් සිදු කිරීමේ චෝදනාව මත, ඇගේ සහෝදරයාට වරෙන්තු නිකුත් කිරීමේ පුවතක්, දිනමිණ පුවත්පතෙහි (මාර්තු 09, 2023) පළ කොට ඇත.
එම පුවත් වාර්තාව තුළ,
* බාලවයස් දැරියගේ සහ ඇයට ලිංගික අපයෝජනය සිදු කළ බවට චෝදනා ලැබූ අයගේ ඥාතීත්වය දක්වා තිබේ.
* ලිංගික අපයෝජනය සඳහා චෝදනා ලැබූ අයගේ සම්පූර්ණ නමත්, ඔහුගේ පදිංචි ලිපිනයත් දක්වා තිබේ.
* එම චෝදනා ලැබූ අය, එම බාලවයස් දැරිය සහ මව සමඟ එම නිවසේ පදිංචි වී සිට ඇති බව ද දක්වා තිබේ.
එසේ නම්,
1) මෙම තොරතුරු ඔස්සේ, ලිංගික අපයෝජනයට ලක්වූ බාලවයස් දැරියගේ අනන්‍යතාවය හෙළි නොවන්නේ ද? එය එම දැරිය අගතියට පත් කිරීමක් නොවන්නේ ද?
2) ලිංගික අපයෝජනයකට ලක් වූ අයෙකුගේ අනන්‍යතාවය හෙළි කිරීමෙන්, දිනමිණ සිය ආචාර ධාර්මික මාධ්‍ය වගකීම පැහැර හැරීමක් කර නොමැති ද?
මූලාශ්‍ර:
https://www.ipso.co.uk/media/1723/sex-off-journo_v4.pdf
https://www.editorscode.org.uk/the_code.php
https://www.ipso.co.uk/editors-code-of-practice/
https://www.legalmatch.com/.../crime-victim-anonymity.html
https://pressgazette.co.uk/.../identifying-sex-crime.../
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

**ලිංගික අපරාධයකට ලක්වූවෙකුගේ අනන්‍යතාවය වක්‍රාකාරයෙන් හෝ හෙළිදරව් නොකරමු!**

# නංගීට හදි කොට උසාවියට කට්ටි පැන්න අයියාට විවෘත වරෙන්තු

මෙලෙස විවෘත වරෙන්තුවක් නිකුත් කර සිටියේ [redacted] ලිපිනයේ පදිං- චිව සිටින [redacted] නමැති විත්තිකරුවය. විත්තිකරු සිය මව හා වයස අවුරුදු 16 ට අඩු බාල වයස්කාර සහෝදරිය සමඟ නිවසේ පදිංචිව සිට තිබේ.

දිනමිණ
The Dinamina

2023-03-09

## ලිංගික අපරාධයකට ලක්වූවෙකුගේ අනන්‍යතාවය වක්‍රාකාරයෙන් හෝ හෙළිදරව් නොකරමු!

# නංගීට හදි කොට උසාවියට කට්ටි පැන්න අයියාට විවෘත වරෙන්තු

මෙලෙස විවෘත වරෙන්තුවක් නිකුත් කර සිටියේ [redacted] ලිපිනයේ පදිං-චිච සිටින [redacted] නමැති විත්තිකරුවය.

විත්තිකරු සිය මව හා වයස අවුරුදු 16 ට අඩු බාල වයස්කාර සහෝදරිය සමඟ නිවසේ පදිංචිව සිට තිබේ.

දිනමිණ
The Dinamina

**2023-03-09**